## ඉන්දියානු ඉතිහාසය ගොඩනැගීමේදී ශ්‍රී ලංකාවේ සාහිත්‍ය මූලාශ්‍රයවලින් ලැබෙන පිටිවහල : ක්‍රි.පූ. 6 වන සියවස සිට ක්‍රි.පු. 4 වන සියවස දක්වා

ඩී. කේ.මනතුංග, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

දකුණු ආසියානු කලාපයේ අනෙකුත් රටවලට වඩා ශක්තිමත් ඓතිහාසික සම්ප්‍රදායකින් හා ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් ශ්‍රී ලංකාව පොහොසත් ය. එම නිසා ඉන්දියාව සහ අනෙකුත් දකුණු ආසියානු රටවල ඉතිහාසය මැනවින් අවබෝධ කරගැනීමට ශ්‍රී ලංකාවේ මූලාශ්‍රය අධ්‍යයනය ඉතා වැදගත් ය.

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍රය මඟින් ක්‍රි.පූ. 6 වන සිට ක්‍රි.පූ. 4 වන සියවස දක්වා ඉන්දියාවේ දේශපාලන ඉතිහාසය ගොඩනගා ගත හැක්කේ කෙසේ ද යන්න විමසා බැලීම යි. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලාංකීය මූලාශ්‍රය ලෙස තෝරා ගනු ලැබුවේ දීපවංසය, මහාවංසය, මහාවංස ටීකාව සහ මහාබෝධිවංසය යි.

දීපවංසය, මහාවංසය, ඇතුළු වංසකතාවන්හි ඇති ඓතිහාසික වටිනාකමත්, මූලාශ්‍රය වශයෙන් එම කෘතීන්හි ඇති විශ්වසනීයත්වයත් බොහෝ විද්වතුන්ගේ පිළිගැනීමට ලක්ව තිබේ. එමෙන් ම මේවායේ ඇතුළත් වී ඇති බොහෝ කරුණු පුරාවිද්‍යා මූලාශ්‍රය මෙන් ම විදේශීය වාර්තා සමඟ සැසඳේ. පුරාණ වැනි ඉන්දීය මූලාශ්‍රයවල ඇතුළත් ඇතැම් කරුණු හෝ ඒවායේ දැක්වෙන දින වකවානු පිළිබඳව හෝ විශ්වාසය තැබීමට ඉතිහාසඥයෝ බොහෝවිට පැකිලෙති. බොහෝ ඉන්දියානු මූලාශ්‍රයවල පවතින අවුල් සහගත තත්ත්වය නිසා ඉන්දීය ඉතිහාසය නිරවුල්ව හැදෑරීම දුෂ්කර තත්ත්වයක පැවතුණි. මේ දුෂ්කර කාර්යයෙහිලා ශ්‍රී ලාංකීය වංසකතා මූලාශ්‍රයවලින් ලැබුණු පිටිවහල ප්‍රමාණය කළ නොහැකි තරම් ය. සෙසු මූලාශ්‍රයයන්ගෙන් පියවාගත නොහැකිව තිබූ කරුණු කීපයක් ම විශේෂයෙන් ක්‍රි.පූ. හයවන සියවසේ සිට ක්‍රි.පූ. හතරවන සියවස දක්වා කාලසීමාවට අදාළව නිගමනය කර ගත නොහැකිව තිබූ දින වකවානු රාශියක් නිරාකරණය කර ගැනීමට මේ ශ්‍රී ලාංකීය මූලාශ්‍රය උපකාරී වේ. ප්‍රස්තුත කාලයට අදාළව උතුරු ඉන්දියාවේ හර්යංක, සිසුනාග, නන්ද, වැනි රාජවංශ පිළිබඳව ශ්‍රී ලංකාවේ වංසකතාවන්හි එන දින වකවානු පුරාණ හා ජෛන ග්‍රන්ථයන්හි සඳහන් වන දින වකවානුවලට වඩා බොහෝ සෙයින් නිවැරදි බව පැහැදිලි ය. එබැවින් මහාවංසය ඇතුළු අනෙකුත් ශ්‍රී ලාංකීය ඓතිහාසික මූලාශ්‍රය පිළිබඳව විධිමත් විමර්ශනයක් මඟින් ඉන්දියානු ඉතිහාසයේ ඇතැම් හිස්තැන් සම්පූර්ණ කරගැනීම සඳහා මනා පිටුවහලක් ලැබෙන බව පෙනී යයි.